# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1718/6 - 2011 අගෝස්තු 08 වැනි සඳුදා - 2011.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝගය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1. මේ නියෝගය "2011 අංක 6 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ) නියෝගය" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, එය නොතකා මේ නියෝගය බලාත්මකව පවතින තාක් කල් සහ එසේ බලපවත්වන තාක් කල් පමණක් මේ නියෝගයේ, පිළිවෙලින් I වැනි උපලේඛනයේ, II වැනි උපලේඛනයේ සහ III වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මහ නගර සභාවල, නගර සභාවල සහ ප්‍රාදේශීය සභාවල, අවස්ථාවෝචිත පරිදි, සභිකයින්ගේ ධූර කාලය, 2011 අගෝස්තු මස 10 වැනි දින දී අවසන් විය යුතු සේ සලකනු ලැබිය යුතු ය.

3. වරින් වර සංශෝධනය කරන ලද 2011 මාර්තු මස 30 වැනි දින, අංක 1699/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2011 අංක 3 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලනය කිරීමේ) නියෝගය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

I වැනි උපලේඛනය

*මහ නගර සභා*

1. දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව.
2. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.
3. මොරටුව මහ නගර සභාව.
4. මීගමුව මහ නගර සභාව.

1A - G 014906— 1,085 (2011/08)

5. ගම්පහ මහ නගර සභාව.
6. ගාල්ල මහ නගර සභාව.
7. මාතර මහ නගර සභාව.
8. මහනුවර මහ නගර සභාව.
9. මාතලේ මහ නගර සභාව.
10. නුවරඑළිය මහ නගර සභාව.
11. කුරුණෑගල මහ නගර සභාව.
12. බදුල්ල මහ නගර සභාව.
13. රත්නපුර මහ නගර සභාව.
14. අනුරාධපුර මහ නගර සභාව.
15. කල්මුණේ මහ නගර සභාව.

**II** වැනි උපලේඛනය

*නගර සභා*

1. කොළොන්නාව නගර සභාව.
2. හම්බන්තොට නගර සභාව.

**III** වැනි උපලේඛනය

*ප්‍රාදේශීය සභා*

1. කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.
2. සූරියවැව ප්‍රාදේශීය සභාව.
3. හම්බන්තොට ප්‍රාදේශීය සභාව.
4. කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව.
5. මහනුවර, කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව.

08-611

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.